# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 80 — 1973 ඔක්තෝබර් 05 වැනි සිකුරාදා — 1973.10.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1359 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | 1379 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1379 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1381 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 28 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1974. 01. 01 සිට 1974. 06. 30 දක්වා ගඟේ වැලි ආදිය සැපයීම ... | 1973. 10. 30 |
| 2. 1974. 01. 01 සිට 1974. 12. 31 දක්වා හුණු ආදිය සැපයීම ... ... | 1973. 10. 30 |
| 3. 1974. 01. 01 සිට 1974. 12. 31 දක්වා වීයළි ගැස් අඟුරු සැපයීම ... ... | 1973. 10. 30 |
| 4. 1974. 01. 01 සිට 1974. 12. 31 දක්වා මෙරට සෑදූ කැටිකළ ගල්හාර සැපයීම ... | 1973. 11. 01 |
| 5. 1974. 01. 01 සිට 1974. 12. 31 දක්වා ගොඩනැගිලි සඳහා (මෙරට සෑදූ) ගඩොල් සැපයීම ... ... | 1973. 11. 06 |

ගඩොල් සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත්‍ර ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස 05 දින,
කොළඹ දී ය.

10-61—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පලවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පලවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

### ත්‍රිකුණාමලය ශ්‍රී ලංකා නාවික හමුද තටාකාංගණයේ පිහිටා ඇති සිනමා හලේ සිනමා දර්ශන පෙන්වීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ත්‍රිකුණාමලය ශ්‍රී ලංකා නාවික හමුද තටාකාංගණයේ පිහිටා තිබෙන, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, සිනමා හලෙහි, සිනමා දර්ශන පෙන්වීම සඳහා ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

2. මේ සඳහා ටෙන්ඩර් අයදුම් පත්, කොළඹ 1, තැ.පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේදී, නාවික හමුදාධිපති විසින් පහත සඳහන් පරිදි නිකුත් කරනු ලැබේ.

| | |
|---|---|
| ටෙන්ඩර් අයදුම් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව ... | 1973 ඔක්තෝම්බර් මස 18 වැනි දින පෙරවරු 12.00 දක්වා |
| ටෙන්ඩර් අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව ... | 1973 ඔක්තෝම්බර් මස 19 වැනි දින පෙරවරු 10.00 දක්වා |
| ටෙන්ඩර් අයදුම් පත් විවෘත කරනු ලබන්නේ ... ... | 1973 ඔක්තෝම්බර් මස 19 වැනි දින පෙරවරු 11.00 |

3. ටෙන්ඩර් අයදුම් පත්, නිකුත් කරනු ලබන්නේ, ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් වන අතර, එම ලිඛිත ප්‍රකාශනයේ සිනමා දර්ශන පෙන්වීමට ඔහුට ඇති හැකියාව, සහ ඔහුගේ ආර්ථික තත්ත්වය පෙන්නුම කළ යුතුය.

4. ටෙන්ඩර් අයදුම් පත් සමග, රු. 75ක තැන්පත් මුදලක් තැබිය යුතු අතර, එම මුදල ආපසු ලබා ගත හැක. මෙ සඳහා චෙක්පත් භාර ගනු නොලැබේ. මුදල් ඇණවුම් භාර ගන්නා අතර, එම මුදල් ඇණවුම් නාවික හමුදාධිපතිගේ නමින් විය යුතුය.

5. අයදුම්කරුවන්, ඔවුන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය, ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

10-18—74.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### නානාත්තන් වී අලෙවි මණ්ඩල සහල් මෝලෙහි සිමේන්ති කමත විශාල කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර

ඉහත සඳහන් කාර්යය සඳහා වී අලෙවි මණ්ඩලයෙහි, කිලිනොච්චි ප්‍රාදේශීය අධිකාරී විසින් ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. අවශ්‍ය ටෙන්ඩර් පත් ආපසු නොගෙවනු ලබන රුපියල් 10ක් ගෙවීමෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත් කැඳවීම 1973.10.22 වෙනි දිනෙන් අවසන් වේ.

කෙ. සබාරත්නම්,
ප්‍රාදේශීය අධිකාරී (උ. ප්‍ර.),
වී අලෙවි මණ්ඩලය, කිලිනොච්චිය.

10-47—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

රත්මලාන, ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් වැලිගම ජලසම්පාදන යෝජනා ක්‍රමය (II කොන්ත්‍රාත්තුව) සඳහා, ගිල්විය හැකි පොම්ප යුගල තුනත්, මෝටරයක්, අමතර කොටස් හා ක්ලෝරිනේටරයක් සැපයීමට සහ සවිකිරීමට ටෙන්ඩර් භාරගනු ලැබේ.

රත්මලාන ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ) විසින් 1973. 10. 19 දින පූ. භා. 10 තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 275 තැන්පත් කර, ඒ සඳහා දෙනු ලබන රිසිට් පත ඉදිරිපත් කළ විට පමණකි. (ආපසු දෙනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල රු. 250 වන අතර රු. 25 ආපසු ගෙවනු නොලැබේ.)

රත්මලාන ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 73.12.28 දින පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන වේලාව වන 73. 12.28 දින ප. ව. 2.30 ට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයකු හෝ පෙනී සිටිය හැක.

වෙනත් අවශ්‍ය කිසියම් විස්තර හෝ තොරතුරු පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැක.

එම්. රත්දෙනිය,
අධ්‍යක්ෂ.

ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන.
1973. 09. 06

10-53—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට දිරූ ගොම පොහොර සැපයීම

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට දිරූ ගොම පොහොර කියුබ් 20ක් සැපයීම හා ගෙනයෙස් භාර දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 ඔක්තෝබර් මස 26 වන දින පස්වරු 2.00 වන තෙක් භාරගනු ලැබේ.

1. මේ සඳහා තෝරාගනු ලබන කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුත්තේ වැලි ගල් ආදියෙන් තොර හොඳින් දිරූ ගොම පොහොරය.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගන්නා ලද ෆෝර්ම්වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට දිරූ ගොම පොහොර සැපයීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝරම් ලබාගත හැක. 1973 ඔක්තෝබර් මස 24 වන දින දවල් 11.00 වනතෙක් ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද, ටෙන්ඩර් පත්‍ර "කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට දිරූ ගොම පොහොර සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ, ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

13. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේ ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට මේ කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රය සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාළ සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සලකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥා පනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදවන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරෝධය දැන්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර කටුගස්තොට බීජ මධ්‍යස්ථානයේ කළමනාකාර තැන ගෙන් දැනගත හැකිය.

හෙ. ශු. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1973ක් වූ සැප්තැම්බර් මස 17 වන දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

10–55—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

නිෂ්සමඟ රාමිය සහ කවාන බලවේග ආයතනවලට විදුලි කම්බි ඇදීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 10. 23 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් එක් වැඩකට රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත්කොට 1973. 10. 22 දින මධ්‍යහ්න 12 ට පෙර කුවිතාන්සිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබාගත යුතුවේ.

සෝපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/66)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 09. 24.

10–46—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 9 දක්වා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් වෙන වෙනම ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල රු. ශ. |
|---|---|---|
| (1) කඩුගන්නාවේ රජයේ වඩු පාසැලේ, පාසැල් ගොඩනැගිල්ලේ අළුත්වැඩියාව ... ... | යටිනුවර ... | 3,000 0 |
| (2) කඩුගන්නාවේ රජයේ වඩු පාසැලේ, ස්ථාභාර නිලධාරිගේ නිළ නිවාසය හා ආරක්ෂක වැට වැඩිදියුණු කිරීම | එම ... | 9,000 0 |
| (3) ගම්පොළ රජයේ වඩු පාසැලේ අළුත්වැඩියාව ... ... ... ... | උඩපළාත ... | 6,000 0 |
| (4) පොල්ගොල්ලේ රජයේ වඩු පාසැලේ ගබඩා කාමරයේ අළුත්වැඩියාව ... ... ... | පාතදුම්බර ... | 6,000 0 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලටද රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනටද 1973 ඔක්තෝබර් මස 27 වැනි දින පෙරවරු 11 තෙක් මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් ඉහත සඳහන් එක් එක් වැඩ වෙනුවෙන් රු. 10 ක මුදලක් මහනුවර කච්චේරියේදී තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කල විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් පස උඩ කෙලවරේ වැඩයේ නම ලියා තැබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම ලේඛනගත තැපැලෙන් නොඑවන්නේ නම් මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහා ලිය හැකිය.

5. 1973 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 9 ට මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

6. තෝරා ගත් ටෙන්ඩර්කරුහට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් (5%) සියයට පහක්, සතුටුදායක ලෙස වැඩය නිම කිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. තෝරා ගත් ටෙන්ඩර්කරු මෙසේ දැනුම් දී දින හතක් ඇතුලත දී ගිවිසුමකට බැඳීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ.

7. වැඩ විස්තර මහනුවර දිසාපතිගෙන් (කුඩා කර්මාන්ත අංශයෙන්) ලබාගත හැකිය.

සුදත් ගුණසේකර,
මහනුවර දිසාපති වෙනුවට.

1973 සැප්තැම්බර් මස 21 වැනි දින,
මහනුවර දිසාපති කාර්‍යාලයේ දී ය.

10–36—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්.එම්. 1505.

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973.10.26 වැනි දින පෙරවරු 9 දක්වා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ලියා පදිංචි විය යුතු මුදල රු. ශ. |
|---|---|---|
| 1. මරියාවත්ත ජනපදයේ අංක 2 පාරේ බෝක්කුව | ගඟ ඉහළ | 25,000 0 (1–5) |
| 2. මොරන්කන්ද ජනපද පාරේ බෝක්කු තැනීම | හාරිස්පත්තුව | |
| 3. රත්මල්කඩුව ජනපද පාරට ගල් අතුරා තාර දැමීම | උඩපළාත | |
| 4. කොළ බෝවිල ජනපදයට නල මගින් ජලය සැපයීම | ගඟ ඉහළ | |
| 5. නවහුණුගල් පතන ජනපද පාර තැනීම | උඩපළාත | |
| 6. මොරගස් කොටුවේ සහ බෙල්ලේ ගොඩ ජනපදවලට පොදු ළිං | පාතදුම්බර | 10,000 0 |
| 7. අට්ටමල්කැලේ ජනපදයේ බීමට සහ නෑමට පොදු ළිං 2ක් | උඩපළාත ... | 7,500 0 |
| 8. උල්ලදුපිටිය ජනපදයේ පොදු ළිං ... | හාරිස්පත්තුව ... | 5,000 0 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලටද, රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1973.10.19 වැනි දින දහවල් 12 තෙක් මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 25ක මුදලක් මහනුවර කච්චේරියේදී තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම්පස උඩ කෙළවරේ වැඩයේ නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම ලේඛනගත තැපැලෙන් නොඑවන්නේ නම්, මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහාලිය හැකිය.

1973.10.26 වැනි දින පෙරවරු 9 ට මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එනම් 1973.10.26 වෙනි දින පෙරවරු 9 ට සියළුම ටෙන්ඩර් කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

7. තෝරාගත් ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලිය විල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් (5%) සියයට පහක් සතුටුදායක ලෙස නිම කිරීමට ඇප වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර්කරුවන්හට මෙසේ දැනුම් දී දින 7ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජසන්තක කරනු ලැබේ.

1973. සැප්තැම්බර් මස 20 වෙනි දින,
මහනුවර දිසාපති කාර්‍යාලයේ දී ය.

ඩී. බී. ගුණරත්නායක,
මහනුවර දිසාපති වෙනුවට.

10–85—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අනුරාධපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1974 ජනවාරි 1 වනදා සිට 1974 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කචේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය මේ ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ ත්මා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුරය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් වන කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩු බාහිරාදිය තබාගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3¼ක් ඇතුළත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවා සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළෙත් වෙනස අඩු කරනු ලැබේ.

එම්. වේදරණියම්,
සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 සැප්තැම්බර් 20 වැනි දින,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරියේ දී ය.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. බඩු බාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද පන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ ක් ඇතුළත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගෙ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගෙ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවා සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළෙත් වෙනය අඩුකරගනු ලැබේ.

ඇම්. වේදරණියම්,
සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් 20,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරියේ දී ය.

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප තැන්පත් මුදල රු. | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයින් සඳහා | | | | | ලෙඩුන් සඳහා | | | | |
| | | | | අළුත් මාළු | හරක් මස් | කරවල | බිත්තර | එළවළු | අළුත් මාළු | හරක් මස් | කරවල | බිත්තර | එළවළු |
| මැදවච්චිය දි. රෝ. ... | 100... | 800... | 1973.11.2 ... පෙරවරු 10 | 700... | 650... | 700... | 650... | 2,200... | 2,000... | 1,100... | 1,900... | 1,900... | 7,000 |

10–12/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම

පුත්තලම දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 73.10.26 දින ප. ව. 2 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය කොළඹ, ගාලුමුවදොර මහලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරන කාමරයේ තබනු ඇත.

| වැඩයේ ස්වභාවය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ලියා පදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|
| බත්තුළුඔය තාර විල්ලුව පොල් තවාන පාර | ආරච්චිකට්ටුව... | 50,000 |
| විල්පොත පාර වැඩි දියුණු කිරීම ... | ආරච්චිකට්ටුව... | 25,000 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට ද, රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරයෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට ද 73.10.23 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් පුත්තලම කච්චේරියෙන් හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට හෝ ඉහත සඳහන් වැඩ වලට එක් එක් වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් හා ඒ වැඩ වලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් මුදලකට ලියා පදිංචි වී ඇති බවට, සාධකයන් පුත්තලම දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. අනුමත කරන ලද සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස් ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ පුත්තලම දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ "..................... සඳහා ටෙන්ඩර් පත්‍රය" යයි සඳහන් කළ යුතුය. සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල් කර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නො එවන්නේ නම්, කොළඹ, ගාලු මුවදොර පිහිටි මහලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරණ කාමරයෙ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහා ලිය යුතුය.

5. 1973.10.26 දින ප.ව. 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවෙ ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පැමිණ සිටිය හැක.

6. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම ටෙන්ඩර් මංඩලය සතුය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දැනුම්දී මෙන් දින 7 (හතක්) ඇතුළත දී වැඩ ගිවිසුමකට අත්සන් කිරීමට ඔහු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන යැවීමෙන් ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගැනෙනවා ඇත.

එසේ දැනුම් දීමෙන් පසුව ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීම අත පසු කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවා ඇත. අසාර්ථක ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට පහක තැන්පත් ඇප මුදලක් වශයෙන් තැන්පත් කළ පසුවයි.

8. මෙම කොන්ත්‍රාත්තුව කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගැනීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකිතාක් බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශය තුලිනි. කම්කරුවන්ට වේතනය ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන හා මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසි වලට අනුකූලව වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත් කරු එකඟ විය යුතුය.

9. වැඩි විස්තර පුත්තලම දිසාපති වෙතින් ලබා ගත හැක.

බ. සු. විජේවීර,
පුත්තලම දිසාපති.

1973.09.20 දින.

10–11/1—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

### පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම

පුත්තලම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 73. 10. 26 වැනි දින ප. ව. 2.00 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ:—

| වැඩයේ ස්වභාවය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|---|
| | | රු. |
| වනාතවිල්ලුව ජ.නි. නිවස අළුත්වැඩියා කිරීම ... ... | පුත්තලම ... | 1,500 |
| ආණමඩුව ජ.නි. නිවස අළුත්වැඩියා කිරීම... | කුමාර වන්නි ... | 1,500 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට ද රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිකිරීම් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට ද 73. 10. 23 දවල් 12 දක්වා පුත්තලම කච්චේරියේදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් පුත්තලම් කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ ඉහත ඇති වැඩවලට එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් හා ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවී ඇති බවට සාධකයන් පුත්තලම දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. අනුමත කරනු ලැබූ සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත් මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම්, ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ පුත්තලම දිසාපති වෙතින් ලබාගත යුතු ආකෘති පත්‍ර මගින්, පිටපත් දෙකින් යුක්තවයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ "ඉල්ලන ටෙන්ඩරයේ නම) සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් විය යුතු අතර සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන තබා සීල්කර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලේඛනගත තැපැලෙන් නොඑවන්නේ නම් පුත්තලම දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහා ලිය හැකිය.

5. 73.10.26 දින ප. ව. 2.30 ට පුත්තලම දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පැමිණ සිටිය හැක.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දනුම් දීමෙන් දින 7 ක් ඇතුලතදී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බව දන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍ර අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් තැන්පත් මුදල රාජසන්තක වනවා ඇත. අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට 5 ක මුදල් ඇප වශයෙන් තැන්පත් කළ පසුය.

8. මෙම කොන්ත්‍රාත් කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර, එවැනි කම්කරුවන් හැකිතාක් බඳවාගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි. කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දනට බල පවත්නා හා මින්පසු ක්‍රියාත්මක විය හැකි රෙගුලාසිවලට අනුකූල වූ වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

9. වැඩි විස්තර පුත්තලම් දිසාපති වෙතින් ලබගත හැකිය.

ඛ. සු. විජේවීර,
පුත්තලම දිසාපති.

1973. 09. 20 දින.

10-11/2—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

අංකය : පී. එස්.සී.2/24/73

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඩී. ඩී. ටී. කුඩු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඩී. ඩී. ටී. කුඩු සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමශීය නිපදවන්නෝ ;
(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;
(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාර, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973, ඔක්තෝබර් මස 30 වෙනි දින පෙරවරු 10.00 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඔස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්තානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1973, සැප්තැම්බර් 20 වැ දින.

අදල උපලේඛනය
SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* |
|---|---|---|
| 1 .. | DDT 75% w.d.p. (should conform to specification WHO/SIF/1.R3 approved on 25th October,1965) Packed in 100 lbs lever locked fibre drums with metal tops and metal chime reinforced fibre bottoms meeting all requirements of all consolidated freight classification rule 41 and bearing a certificate of maker stating that they so conform, the drums should contain an inner liner or bag of pliofilm 140 or 235 gauge or of polycthylene or equivalent, minimum thickness 0.1. mm the inner liner of bag should be hermetically sealed after filling. | 1,000,000 |

*Delivery terms.*—The full quantity of the supply should be despatched to Colombo, Sri Lanka, in one lot within three months of date of order.

10-57—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතු කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරණු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයුම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුලු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරණු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් වන කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කරනැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරණු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරණු ලැබේ.

(iii) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරණු ලැබේ.

(අ) කූපන් වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරණ ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවා සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරණු ලැබේ.

එම්. වේදරනියම්,
සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් 28 වැනි දින,
අනුරාධපුර, සෞඛ්‍ය සේවා අධිකාරියේදී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප තැන්පත් මුදල් | (4) ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | (5) ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන — සේවකයින් සඳහා: අලුත් මාලු | කරවල | බිත්තර | එළවලු | ලෙඩුන් සඳහා: අලුත් මාලු | කරවල | බිත්තර | එළවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | |
| ඇලයාපත්තුව මා. නි. | 100 | 300 | | 150 | 300 | 150 | 400 | 100 | 200 | 100 | 300 |
| එප්පාවල මා. නි. | 100 | 400 | | 250 | 500 | 250 | 750 | 900 | 1,500 | 900 | 2,500 |
| ගලෙන්බිඳුනුවැව මා. නි. | 100 | 400 | | 100 | 200 | 150 | 400 | 500 | 900 | 600 | 1,500 |
| හබරන මා. නි. | 100 | 400 | | 100 | 200 | 100 | 300 | 200 | 100 | 200 | 600 |
| කැබිතිගොල්ලෑව මා. නි. | 100 | 400 | | 150 | 250 | 150 | 350 | 200 | 300 | 150 | 400 |
| මරදන්කඩවල මා. නි. | 100 | 400 | | 200 | 400 | 200 | 600 | 350 | 750 | 350 | 1,000 |
| මහවිලච්චිය මා. නි. | 100 | 300 | 1973.10.30 | 200 | 350 | 200 | 500 | 100 | 250 | 100 | 400 |
| මොරවැව මා.නි. | 100 | 300 | පෙරවරු 10 | 200 | 400 | 200 | 600 | 400 | 800 | 400 | 1,200 |
| නෑගම්පහ මා. නි. | 100 | 400 | | 200 | 300 | 150 | 400 | 200 | 400 | 200 | 600 |
| පුල්මොට්ටෙයි මා. නි. | 100 | 300 | | 100 | 200 | 100 | 300 | 100 | 300 | 150 | 400 |
| රණෝරාව මා. නි. | 100 | 300 | | 200 | 400 | 200 | 600 | 100 | 200 | 100 | 350 |
| රත්මල්ගහවැව මා. නි. | 100 | 400 | | 300 | 300 | 200 | 500 | 200 | 200 | 150 | 400 |
| රාජාංගනය මා. නි. | 100 | 300 | | 100 | 200 | 100 | 300 | 100 | 200 | 100 | 300 |
| තලාව මා. නි. | 100 | 400 | | 400 | 450 | 200 | 700 | 500 | 1,000 | 500 | 1,400 |
| තඹුත්තේගම මා. නි. | 100 | 300 | | 150 | 300 | 150 | 450 | 150 | 300 | 150 | 400 |

10–35—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුව කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ සහ නොපිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වැනිද සිට 1974 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලයතුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ සහ නොපිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දහවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැකිය. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත්කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්කර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිවරුවන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (!!) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, මඩකලපුව" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයුම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.** — ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවැනි ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩරකරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමෙහි කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයුමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සළාක නොවන මිළට සපයන අතර ඒසඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් නියෝග විටින්විට නියෝග කරන ලද මිලට ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලකා නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසිම අවස්ථාවකදී සලාක සැපයුවහොත් ඒ සහල් සඳහා සළාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iii) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාරදුන්හොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළෙත් වෙනස අඩු කරනු ලැබේ.

වෛද්‍ය වි. සිංගනායගම්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් මස 19 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරිගේ කාර්යාලයේදීය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1974 ගබඩා බඩු ඇදීම

**සේවය සඳහා ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයන්.**—මේ කාර්‍යාලයෙන් හෝ මෙහි මතු 2 වැනි ඡේදයේ සඳහන් කාර්‍යාලවලින් හෝ ඉල්ලා ලබාගත යුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි 1974.01.01 දින සිට 1974.12.31 වැනිද දක්වා වකවානුව තුළ දුම්රියපොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින්/ආයතනවලට/කාර්‍යාලයට/කාර්‍යාලයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයන්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමුපකාර සමිතිවලිනුත් මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි තැන ටැන්ඩර් භාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු හා පැටවීම් කුළී ද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතයි. රු. 100 ක මුදලක් ළඟම ඇති කච්චේරියේ මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි නමට තැන්පත් කොට එහි ලදු පත ලබාගෙන ටැන්ඩර් පත්‍ර නිකුත්කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් මස 13 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලවලින් ලබා ගත හැකිය :—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කලුතර | මාතලේ | වව්නියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියැවුනු කවර හෝ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයකින් ලබාගත හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර "බඩු ඇදීම සඳහා ටැන්ඩරය" යනුවෙන් වම් පැත්තේ උඩ කෙළවරේ සළකුනක් තබා මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් මස 14 වනද පෙරවරු 10 ට පෙර මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයි. ටැන්ඩර් කරුවන් කැමති නම් ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත් අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලවල ලේකම්/ගණකාධිකාරි වෙත භාර දී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිළි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් හා මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සළකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සැහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විට දක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් මස 14 වනද පෙරවරු 10 ට මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයන්ට හෝ තමන් කැමති නම් මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි සමඟ විධිවිධාන සලසාගෙන ඔහුගේ අවසරය පිට ටැන්ඩර් විවෘත කරන විට පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ 2 වැනි පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන් තමන් ඉදිරිපත්කරන මිළ ගණන්, ටැන්ඩර් භාරගැනීම අවසන් වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුව අස්කළ හැකි නොවේ.

10. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටුකිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටුකිරීමේ දී ටැන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයන් පමණකි. මෙහි දී "ලාංකිකයා" යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි ගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සළකා කොන්ත්‍රාත්තුව අවලංගු කොට එහි කොන්දේසි ප්‍රකාර දඩයන් ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥා පනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම, එකතු කිරීම, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත්කරන්නට යෙදුන යම් හිමිකමක් වෙතොත් කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයක් ම ආණ්ඩුව මුදගත යුතුයි.

13. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි තැන ඉල්ලා සිටින පරිදි මුලු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 1,500 කට නොවැඩි ඇප මුදලක් තැබීම් අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටුකරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය භාරගත් බව මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර් කරුට දන්වා දස දිනක් ඇතුළත දී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලි වුවොත් හෝ අපොහොසත් වුවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වී රජයේ ගිවිසුම් පැහැරහරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නම ද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩර් භාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය දමා තිබේ නම් එය ටැන්ඩර්කරුට ලැබුනු බව ගණන් ගනු ලැබේ.

15. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි ගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීමට හෝ බෙදා දීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටුකරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි තැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කල ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිව ටැන්ඩර් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ පිටු දකීමත්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන සමඟ කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමති කෙනෙකු ලව එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත තිබේ. එබඳු විටක දී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක් නොවේ.

19. ඉහත කී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් භාර දීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වුවොත් නැත්නම් අපොහොසත් වුවහොත් හෝ ඒ බඩු භාරදීමට පිට පිට අපොහොසත් වුවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාසේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නම ද ඇතුළත්වීමට ඉඩ තිබේ.

20. ශ්‍රී ලංකා ජනරජයේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදාල වෙයි.

21. ටැන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහි ලා සඳහන් සියලු කොන්දේසි අකුරටම සපුරා නැතොත් කිසිදු ටැන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් ඇතොත් ඉහත 2 වැනි ඡෙදයේ දක්වෙන කාර්‍යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණය කිට්ටුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්‍යාලවලට කොපමණ දුරක් තිබේ ද යන වග මේ සමඟ ඇති උප ලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වගනොකියයි.

25. **ගබඩා බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අයකිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙනගොස් භාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැති වුවහොත්, හෝ සොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්/හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එයද ඇතුළත් කොට අලාභහානි සිදුවූ හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුලු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමඟ දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දන්විය යුතු මිළ ගණන්.**—(අ) (1) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී—1 උප ලේඛනයෙහි දක්විය යුතු —

පළමුවැ රත්තල් 28 දක්වා ද;

දෙවැනුව රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද;

තුන්වැනුව රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද;

සිව්වැනුව රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද;

පස්වැනුව හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද;

හයවැනුව හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද;

හත්වැනුව හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද;

අටවැනුව හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද;

නම්වැනුව හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද;

දහවැනුව හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) මුදල් ගෙවනු ලබන්නේ ඉතා වැඩි කොටසේ දක්වෙන මුලු දුර ප්‍රමාණයම ගෙනයන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

(බී) (i) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුලු දුරම ගෙනයෑම සඳහා මතු සටහන් වැටි 4 යටතේ බී—2 උප ලේඛනයෙහි මිළ ගණන් දක්විය යුතුයි:—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා;

(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා;

(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා;

(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුලු දුරම ගෙනයාම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනම දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුලු දුරම සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතු අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩිනම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(සී) (i) එක් බඩු තොගයක අඩංගු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩු වේ නම් ඒවායේ ගෙවීම බී 1 උප ලේඛනය යටතේ විය යුතුයි.

(සී) (ii) එක් බඩු තොගයක අඩංගු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩි නම් ඒවායේ ගෙවීම් බී 2 උපලේඛනය යටතේ විය යුතුයි.

(සී) (iii) එක් බඩු තොගය යනුවෙන් මේ වගන්තියේ අදහස් වන්නේ දුම්රිය ස්ථානයේ දී ඕනෑම දිනයක කොන්ත්‍රාත්කරුට බෙද හැරීම පිණිස භාරදෙන ලද මුලු බඩු ප්‍රමාණය හා ඕනෑම දිනයක දුම්රිය ස්ථානය වෙත ගෙනයෑම පිණිස ආයතනවලින් භාර දෙන ලද මුලු බඩු ප්‍රමාණයයි.

(ඩී) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණතා විය යුතු අතර යාබද බර භාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩිවිය යුතු නොවේ.

27. මේ දන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර් කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමඟ මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

සී. ඩී. හේරත්,
සෞඛ්‍ය සේවා අධිකාරි.

1973 සැප්තැම්බර් මස 22 වැනි දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලය.

දිනය :————.

————,
නිකුත්කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

**1974 ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසිවල 24 වැනි ඡෙදයේ කියවන උපලේඛනය**

මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරිය—දුම්රිය පොළෙන්/පොළට/ආයතනවලින්/ආයතනවලට, කාර්යාලවලින්/කාර්යාලවලට දුර ප්‍රමාණය දළ වශයෙන්—

| දුම්රිය පොළෙන්/පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට, කාර්යාලවලින්/කාර්යාලවලට | කිට්ටුවෙන් සැළකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| | **1 වන කොටස—මහනුවර නගරය** | – |
| මහනුවර | මහනුවර මහ රෝහල | ¾ |
| | ප්‍රාදේශීය බෙහෙත් ගබඩාව | ¾ |
| | සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය | ¾ |
| | බාහිර රෝගීන්ගේ බෙහෙත්හල සහ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලය | ¼ |
| | සිල්වෙස්තර් පාසැල් දන්ත චිකිත්සාගාරය | ¾ |
| | ට්‍රිනිටි පාසැල් දන්ත චිකිත්සාගාරය | 1 |
| | ධර්මරාජ පාසැල් දන්ත චිකිත්සාගාරය | ¾ |
| | මහමායා පාසැල් දන්ත චිකිත්සාගාරය | 1¼ |
| | පුෂ්පදාන පාසැල් දන්ත චිකිත්සාගාරය | ¼ |
| | මහනුවර පාසැල් වෛද්‍ය නිලධාරි කාර්යාලය | 1 |
| | **2 වන කොටස—මහනුවර** | |
| කටුගස්තොට | ගලගෙදර සෞඛ්‍ය කාර්යාලය | 11¼ |
| | ගලගෙදර පර්යන්ත ඒකකය | 11 |
| | මැදවල පර්යන්ත ඒකකය | 6½ |
| | කටුගස්තොට පර්යන්ත ඒකකය | 1 |
| | ශ්‍රී රාහුල විද්‍යාලයීය දන්ත චිකිත්සාගාරය | 1½ |
| | හාරිස්පත්තුව සෞඛ්‍ය කාර්යාලය | 3 |
| | අකුරණ ග්‍රාමීය රෝහල | 4 |
| | බොක්කාවල මධ්‍යම බෙහෙත්හල | 12 |
| | පූජාපිටිය මධ්‍යම බෙහෙත්හල | 9 |
| | තිත්තපජ්ජල මාතෘ නිවාසය | 4½ |
| | අන්කුඹුර ග්‍රාමීය රෝහල | 13 |
| වත්තේගම | යක්ගහපිටිය මධ්‍යම බෙහෙත් හල | 5 |
| | මඩුල්කැලේ දිසා රෝහල | 11 |
| | වත්තේගම ග්‍රාමීය රෝහල | 3¼ |
| | වත්තේගම සෞඛ්‍ය කාර්යාලය | ¼ |
| | වත්තේගම ක්‍රයිස්ට් චර්ච් විද්‍යාලයීය දන්ත චිකිත්සාගාරය | 1 |
| | ගලපිහිල්ල මාතෘ නිවාසය | 3 |
| | හුරිකඩුව පර්යන්ත ඒකකය | |
| | නාරම්පනාව මධ්‍යම බෙහෙත් හල | 7 |
| | මඩවල මාතෘ නිවාසය | 3 |
| | **3 වන කොටස—මහනුවර** | |
| මහනුවර | මිනිපේ පර්යන්ත ඒකකය | 45 |
| | අඹගහපැලැස්ස මාතෘ නිවාසය | 45 |
| | බටුමුල්ල ග්‍රාමීය රෝහල | 46 |
| | කොලොන්ගොඩ මාතෘ නිවාසය | 45 |
| | මැදමහනුවර සෞඛ්‍ය කාර්යාලය | 19 |
| | දුන්හින්න මාතෘ නිවාසය | 23 |
| | මාරස්සන පර්යන්ත ඒකකය | 13 |
| | තලාතුඔය ග්‍රාමීය රෝහල | 6½ |
| | උඩුවෙල ග්‍රාමීය රෝහල | 6 |
| | තලාතුඔය සෞඛ්‍ය කාර්යාලය | 7 |
| | මැද මහනුවර මධ්‍යම බෙහෙත් හල | 19 |
| | රංගල මධ්‍යම බෙහෙත් හල | 25 |
| | හොනාගම මාතෘ නිවාසය | 22½ |
| | මයිලපිටිය මධ්‍යම බෙහෙත් හල | 12 |
| | පල්ලේවත්ත මධ්‍යම බෙහෙත් හල | 41 |
| | මාඩුගොඩ ග්‍රාමීය රෝහල | 26 |
| | තෙල්දෙනිය දිසා රෝහල | 18 |
| | හඟුරන්කෙත මධ්‍යම බෙහෙත් හල | 17½ |
| | රිකිල්ලගස්කඩ පර්යන්ත ඒකකය | 20 |
| | මතුරට දිසා රෝහල | 28 |
| | මතුරට සෞඛ්‍ය කාර්යාලය | 22 |
| | මන්දරන් නුවර මධ්‍යම බෙහෙත් හල | 25 |
| | කෙන්ගල්ල මහා විද්‍යාලයීය දන්ත චිකිත්සාගාරය | 7 |

| දුම්රිය පොළෙන්/පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට, කායයාලවලින්/කායයාලවලට | කිවටුවෙන් සැළකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| | **4 වන කොටස—මහනුවර** | |
| රඹුක්කන ... ... | එරමුදුලියද්ද ග්‍රාමීය රෝහල ... ... ... ... | 14 |
| | හතරලියද්ද ග්‍රාමීය රෝහල ... ... ... ... | 9½ |
| කඩුගන්නාව ... ... | කඩුගන්නාව පර්යන්ත ඒකකය ... ... ... ... | 1 |
| | වට්ටප්පොල මධ්‍යම බෙහෙත් හල ... ... ... | 5 |
| | කොටලිගොඩ ග්‍රාමීය රෝහල ... ... ... ... | 8 |
| | පමුණුව මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 5 |
| | කඩුගන්නාව සෞඛ්‍ය කායයාලය ... ... ... ... | ¾ |
| | පිළිමතලාව පාඨශාලයීය දන්ත චිකිත්සාගාරය ... ... ... | 3 |
| පේරාදෙනිය හන්දිය ... | මාම්පිටිය ග්‍රාමීය රෝහල ... ... ... ... | 2 |
| | ඊරියගම මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 1 |
| | මුරුතලාව මාතෘ නිවාසය ... ... ... ... | 5 |
| | දස්කර පාඨශාලීය දන්ත චිකිත්සාගාරය ... ... ... | 3 |
| පේරාදෙනිය සරසවි දුම්රියපොළ ... | පේරාදෙනි විශ්ව විද්‍යාලයීය දන්ත චිකිත්සාගාරය ... ... ... | 2 |
| | ගලහ මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 15 |
| | දෙල්තොට දිසා රෝහල ... ... ... ... | 19 |
| | **5 වන කොටස—මහනුවර** | |
| ගම්පල ... ... | පුස්සැල්ලාව දිසා රෝහල ... ... ... ... | 12 |
| | බඹරදෙනිය මාතෘ නිවාසය ... ... ... ... | 6 |
| | පන්විලතැන්න ග්‍රාමීය රෝහල ... ... ... ... | 10¼ |
| | ගම්පල දිසා රෝහල ... ... ... ... | ¾ |
| | ගම්පල සෞඛ්‍ය කායයාලය ... ... ... ... | ¾ |
| | ගම්පල සහිරා විද්‍යාලයීය දන්ත චිකිත්සාගාරය ... ... ... | 1½ |
| | උඩගම මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 12¾ |
| හැටන් ... ... | හැටන් මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | ½ |
| | මස්කෙළිය දිසා රෝහල ... ... ... ... | 12 |
| | දික්ඔය දිසා රෝහල ... ... ... ... | 5½ |
| | බොගවන්තලාව දිසා රෝහල ... ... ... ... | 14 |
| වටවල ... ... | වටවල දිසා රෝහල ... ... ... ... | 3 |
| | ලක්ෂපාන ග්‍රාමීය රෝහල ... ... ... ... | 14 |
| නාවලපිටිය ... ... | ගිනිගත්හේන පර්යන්ත ඒකකය ... ... ... ... | 9 |
| | දෙලොස්බාගේ දිසා රෝහල ... ... ... ... | 12 |
| | නාවලපිටිය දිසා රෝහල ... ... ... ... | 1 |
| | නාවලපිටිය සෞඛ්‍ය කායයාලය ... ... ... ... | ½ |
| | කොත්මලේ මධ්‍යම බෙහෙත් හල... ... ... ... | 9 |
| | **6 වන කොටස—නුවරඑළිය** | |
| උලපනේ ... ... | මොරපේ මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 10 |
| කොටගල ... ... | කොටගල දිසා රෝහල ... ... ... ... | 2 |
| | විජේබාහුකන්ද මධ්‍යම බෙහෙත් හල ... ... ... | 12 |
| තලවකැලේ ... ... | ළිඳුල දිසා රෝහල ... ... ... ... | 3 |
| | ආගරපතන දිසා රෝහල ... ... ... ... | 14 |
| වටගොඩ ... ... | පුන්ඩලුඔය මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 7 |
| | රම්බොඩ දිසා රෝහල ... ... ... ... | 14 |
| | මල්දෙනිය ග්‍රාමීය රෝහල ... ... ... ... | 21 |
| | **7 වන කොටස—නුවරඑළිය** | |
| නානුඔය ... ... | නානුඔය මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 1½ |
| නුවරඑළිය ඕ.ඒ. ... ... | නුවරඑළිය මූලික රෝහල ... ... ... ... | 1½ |
| | නුවරඑළිය සෞඛ්‍ය කායයාලය ... ... ... ... | 1 |
| | කඳපොල මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 8 |
| රාගල ඕ.ඒ. ... ... | මඩුල්ල මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 17 |
| | නිල්දන්ඩාහින්න මධ්‍යම බෙහෙත් හල ... ... ... | 13 |
| | මුල්හාල්කැලේ දිසා ඉරෝහල ... ... ... ... | 10 |
| | උඩපුස්සැල්ලාව දිසා රෝහල ... ... ... ... | 8 |
| | තෙරිපැහැ මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 21 |
| | රූපහ මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 13 |
| | මානකොල මධ්‍යම බෙහෙත් හල ... ... ... ... | 27 |
| | කුරුපනාවල මධ්‍යම බෙහෙත් හල ... ... ... | 14 |
| | කලගන්වත්ත මධ්‍යම බෙහෙත් හල ... ... ... | 18 |
| | අරුක්වත්ත මධ්‍යම බෙහෙත් හල ... ... ... | 28 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර කොට්ඨාශය

### කිලිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—වර්ෂ 1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම්වල ලියා පදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කල යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකියයුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 4 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, මහනුවර '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන්කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට හෝ (මා හට) දීමෙන් එය ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙ. ව. 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවැනි ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනිකුත් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැලැස්සුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන් වලට අනුව වට්ටරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැතිකිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පළමුව ඒවායේ විෂබීජ නැතිකිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩරකරුවන්ට උවමනා නම් **කොටස්** හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

සී. ඩී. හේරත්,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
මහනුවර, 1973 සැප්තැම්බර් මස 22 වැනි දින.

## උපලේඛනය

| ආයතන අංශය හා ඊට අයත් වාට්ටු ආදී විස්තර | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. | ඇප මුදල රු. | ශ. | මසකට සේදිය යුතු කැලි ගණන | මසකට සේදිය යුතු වාර ගණන | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| **මහනුවර මහරෝහල** | | | | | | | |
| අංශය 1—ගෙවන වාට්ටු—පළමුවැනි සහ දෙවැනි පංතියේ සහ ලේ බැංකු ... | 50 | 0 | 100 | 0 | 2,750 | 8 | |
| අංශය 2—ප්‍රධාන ශල්‍යාගාර ... ... ... | 50 | 0 | 150 | 0 | 11,000 | 30 | |
| අංශය 3—8 සහ 9 වාට්ටු (මාතෘ අංශය) ... ... ... | 50 | 0 | 150 | 0 | 8,500 | 30 | |
| අංශය 4—14 සහ 15 වැනි වාට්ටු සහ ගැහැණු ඇස් වාට්ටු ... ... | 50 | 0 | 100 | 0 | 3,000 | 10 | |
| අංශය 5—1 සහ 2 වැනි වාට්ටු (පිරිමි ශල්‍ය), පිරිමි ඇස් වාට්ටු සහ පිරිමි ක.නා.උ. වාට්ටු ... ... ... | 50 | 0 | 100 | 0 | 3,100 | 10 | |
| අංශය 6—11 බී සහ 13 වාට්ටු (ගැහැණු ශල්‍ය), ගැහැණු සහ පිරිමි විකලාංග අංශය සහ ගැහැණු ක.නා.උ. වාට්ටුව | 50 | 0 | 100 | 0 | 4,300 | 10 | |
| අංශය 7—7 වෙනි වාට්ටුව (ළමා) ... ... ... | 50 | 0 | 150 | 0 | 9,500 | 30 | |
| අංශය 8—16, 12ඒ, 12බී. සහ 10 වෙනි වාට්ටු (වෛද්‍ය ප්‍රතිකාර පිරිමි) ... | 50 | 0 | 100 | 0 | 3,750 | 8 | |
| අංශය 9—3ඒ, 3බී, 5, 6, සහ 11 වාට්ටු (කාශ රෝගීන්ගේ වාට්ටු) ... | 50 | 0 | 100 | 0 | 1,300 | 8 | 1973 |
| අංශය 10—4 වෙනි වාට්ටුව (පිරිමි ශල්‍ය) ... ... | 50 | 0 | 100 | 0 | 1,500 | 8 | නොවැම්බර් මස 14 |
| අංශය 11—බාහිර රෝගීන්ගේ විකලාංග, ක.නා.උ., ඇස්, දන්ත සහ ශල්‍ය චිකිත්සාගාර අංශයන් | 50 | 0 | 100 | 0 | 1,000 | 4 | වැනි දින පෙ.ව.10ට |
| අංශය 12—බෙහෙත් ශාලාව, වෛද්‍ය චිකිත්සාගාරය, රෝග නිදානඥ රසායනාගාරය, මුළුතැන්ගෙය, රශ්මිචිකිත්සාගාරය, භෞතචිකිත්සක අංශය, පාලන අංශය, ගිලන්රථ ගරාජය, ඇපෝතිකරිවරුන්ගේ නිල කාමර | 50 | 0 | 100 | 0 | 800 | 4 | |
| අංශය 13—19 සහ 20 වෙනි වාට්ටු (වෛද්‍ය ප්‍රතිකාර, ගැහැණු), භික්ෂු සහ මානසික රෝගීන්ගේ වාට්ටු | 50 | 0 | 100 | 0 | 2,500 | 8 | |
| අංශය 14—ශල්‍යාගාරය (අළුත් ගොඩනැගිල්ල) ... ... | 50 | 0 | 150 | 0 | 9,000 | 30 | |
| අංශය 15—හෙදි නිවාස ... ... ... ... | 10 | 0 | 50 | 0 | 100 | 2 | |

10–52/3—73.10.05 දින අංක 80 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ජාතික කිරි ව්‍යාපාරය—කල් තබා ගත හැකි එළකිරි (ටෝන්) එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි මස 1 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයෙහි සඳහන් වන සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට කල් තබා ගත හැකි එළ කිරි (ටෝන් කිරි) ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරීතැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා ඇප මුදල් තැන්පත් කිරීම.**—රු. 100 ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයන්හි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ.

ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝරම භාර ගැනීමේ දිනයට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමඟ ඇති උප ලේඛනයෙහි 3 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන ලද කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ටෙන්ඩර්පත්‍ර මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මහනුවර සෞඛ්‍යසේවා අධිකාරී කාර්යාලයේ ගණකාධිකාරී/ලේකම් වෙත භාර දී එය ලැබුණු බවට ඔහු විසින් කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක.

